සැ.යු : 2015.07.10 දින පළවූ අංක 1923 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,924 - 2015 ජූලි මස 17 වැනි සිකුරාදා - 2015.07.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 454 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 455 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 457 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 459 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


සැ.යු : සේවක අයවැය සහන දීමනා පනත් කෙටුම්පත 2015 මැයි මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 අගෝස්තු මස 07 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජූලි මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය.''*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය* www. documents. gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


453 – B 080965—352 (2015/07)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2015 අංක 299

MOD/DEF/2/01/ARF/RES/400.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරි 2013 මැයි මස 15 වන දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් සත්කෝරලගේ සුගත් චමින්ද ප්‍රනාන්දු ශ්‍රීලංසංබ (නි/68670)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 මැයි මස 30 වැනි දින,
කොළඹ දී ය.

07-611

2015 අංක 300

MOD/DEF/2/01/ARF/RES/397.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරි 2013 මැයි මස 15 වන දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් නවීන් එරංග ගුණරත්න, ශ්‍රීලංසංබ (නි/68672)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 මැයි මස 30 වැනි දින,
කොළඹ දී ය.

07 - 773

2015 අංක 301

MOD/DEF/2/01/ARF/RES/430.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරි 2013 සැප්තැම්බර් මස 25 වැනි දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් දඩල්ලගේ ගයාල් සමන්ත අමරනාත්, ශ්‍රීලංසංබ (නි/67106)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 ජූලි මස 17 වැනි දින,
කොළඹ දී ය.

07-609

2015 අංක 302

MOD/DEF/2/01/ARF/RES/405.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරිණී 2013 අප්‍රේල් මස 30 වැනි දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික කපිතන් ජොහානස් කුලසිංහලාගේ සඳමිණි එරන්‍යා ශ්‍රීලයුකාබ (නි/67868)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 මැයි මස 30 වැනි දින,
කොළඹ දී ය.

07-610

2015 අංක 303

MOD/DEF/2/01/ARF/RES/395.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරී 2013 මැයි 15 වැනි දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් මැදගම්මැද්දේ ගෙදර ශෂික විරාජ් කුමාර අමුණවත්ත, ශ්‍රීලංසංබ (නි/68684)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 මැයි මස 22 වැනි දින,
කොළඹ දී ය.

07-612

---

2015 අංක 304

MOD/DEF/03/02/VNF/TRN/54.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද ස්වේච්ඡා
නාවික උප සේවයට මාරු කිරීමක්

2015 ජූලි මස 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත නම් සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා නාවික හමුදා ස්වේච්ඡා බලකායේ සිට ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් (ස්වේ) සික්කු බඩුගේ චන්ද්‍රලාල් අශෝක පද්මසිරි, එන්වීඑක්ස් 5464, ශ්‍රීලංස්වේනාහ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජුනි මස 01 වැනි දින,
කොළඹ දී ය.

07 - 878

---

2015 අංක 305

MOD/DEF/03/02/VNF/RES/51.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2015 ජුනි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදා ස්වේච්ඡා බලකායේ පහත නම සඳහන් නිලධාරියා අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

උප ලුතිනන් (ස්වේ) බීන් ෆරූන් ධායින්, එන්වීඑක්ස් 5767, ශ්‍රීලංස්වේනාහ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මැයි මස 18 වැනි දින,
කොළඹ දී ය.

07 - 879

---

## අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2015 අංක 306

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ කේ. ඩී. එස්. රුවන්චන්ද්‍ර මහතා 2015 මාර්තු මස 18 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

07 - 787/1

2015 අංක 307

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ එන්. වේදනායගම් මහතා 2015 මාර්තු මස 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු යාපනය පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

07 - 787/2

---

2015 අංක 308

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ආර්. කේතීස්වරන් මහත්මිය 2015 මාර්තු මස 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු මුලතිව් පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

07 - 787/3

---

2015 අංක 309

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ එස්. අරුමෛයිනායගම් මහතා 2015 මාර්තු මස 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු කිලිනොච්චි පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

07 - 787/4

---

2015 අංක 310

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ආර්. සෝමසිංහ මහතා 2015 අප්‍රේල් මස 08 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

07 - 787/5

---

2015 අංක 311

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ කේ. ඩී. එන්. රංජිත් අශෝක මහතා 2015 අප්‍රේල් මස 08 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු මුදල් අමාත්‍යාංශයේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

07 - 787/6

2015 අංක 312

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ එන්. එච්. එම්. චිත්‍රානන්ද මහතා 2015 අප්‍රේල් මස 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

07 - 787/7

# රජයේ නිවේදන

**ඉඩම් සංවර්ධන ආඥාපනත (320 අධිකාරය)**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 6(1) වගන්තිය යටතේ ගරු ඉඩම් අමාත්‍යතුමා විසින් මහ කුඹුරගේ සිරිවර්ධන මහතා ඔහුගේ රාජකාරිවලට අමතර වශයෙන් 2015.05.01 දින සිට අනුරාධපුරය, මාතලේ, කුරුණෑගල දිස්ත්‍රික්ක සඳහා ඉඩම් නිලධාරියෙකු ලෙස පත් කර ඇත.

ආචාර්ය අයි. එච්. කේ. මහානාම,
ලේකම්,
ඉඩම් අමාත්‍යාංශය.

ඉඩම් අමාත්‍යාංශය,
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
මිහිකත මැදුර, 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 673/1

---

**ඉඩම් සංවර්ධන ආඥාපනත (320 අධිකාරය)**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 6(1) වගන්තිය යටතේ ගරු ඉඩම් අමාත්‍යතුමා විසින් පේසාගේ පියසේන මහතා ඔහුගේ රාජකාරිවලට අමතර වශයෙන් 2015.05.01 දින සිට අනුරාධපුරය, මාතලේ, කුරුණෑගල දිස්ත්‍රික්ක සඳහා ඉඩම් නිලධාරියෙකු ලෙස පත් කර ඇත.

ආචාර්ය අයි. එච්. කේ. මහානාම,
ලේකම්,
ඉඩම් අමාත්‍යාංශය.

ඉඩම් අමාත්‍යාංශය,
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
මිහිකත මැදුර, 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 673/2

**ඉඩම් සංවර්ධන ආඥාපනත (320 අධිකාරය)**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 6(1) වගන්තිය යටතේ ගරු ඉඩම් අමාත්‍යතුමා විසින් වන්නිනායක මුදියන්සේලාගේ රත්නායක මහතා ඔහුගේ රාජකාරිවලට අමතර වශයෙන් 2015.05.01 දින සිට අනුරාධපුරය, මාතලේ, කුරුණෑගල දිස්ත්‍රික්ක සඳහා ඉඩම් නිලධාරියෙකු ලෙස පත් කර ඇත.

ආචාර්ය අයි. එච්. කේ. මහානාම,
ලේකම්,
ඉඩම් අමාත්‍යාංශය.

ඉඩම් අමාත්‍යාංශය,
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
මිහිකත මැදුර, 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 673/3

---

**ඉඩම් සංවර්ධන ආඥාපනත (320 අධිකාරය)**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 6(1) වගන්තිය යටතේ ගරු ඉඩම් අමාත්‍යතුමා විසින් නවරත්න දිසානායකලාගේ සුනිල් රත්නායක මහතා ඔහුගේ රාජකාරිවලට අමතර වශයෙන් 2015.05.01 දින සිට අනුරාධපුරය, මාතලේ, කුරුණෑගල දිස්ත්‍රික්ක සඳහා ඉඩම් නිලධාරියෙකු ලෙස පත් කර ඇත.

ආචාර්ය අයි. එච්. කේ. මහානාම,
ලේකම්,
ඉඩම් අමාත්‍යාංශය.

ඉඩම් අමාත්‍යාංශය,
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
මිහිකත මැදුර, 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 673/4

**ඉඩම් සංවර්ධන ආඥාපනත (320 අධිකාරිය)**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 6(1) වගන්තිය යටතේ ගරු ඉඩම් අමාත්‍යතුමා විසින් අතපත්තු මුදියන්සේලාගේ මුදලිහාමිලාගෙදර සරත් ආනන්ද මහතා ඔහුගේ රාජකාරිවලට අමතර වශයෙන් 2015.05.01 වැනි දින සිට අනුරාධපුරය, මාතලේ, කුරුණෑගල දිස්ත්‍රික්ක සඳහා ඉඩම් නිලධාරියෙකු ලෙස පත් කර ඇත.

ආචාර්ය අයි. එච්. කේ. මහානාම,
ලේකම්,
ඉඩම් අමාත්‍යාංශය.

ඉඩම් අමාත්‍යාංශය,
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
මිහිකත මැදුර, 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 673/5

---

**තැපැල් දෙපාර්තමේන්තුව**

තැපැල් කාර්යාල ආඥාපනතේ 45 වගන්තිය යටතේ සකස් කරනු ලබන රීතිය

**2012.01.01 වැනි දින සිට 2012.12.31 වැනි දින දක්වා නිකුත් කල මුදල් ඇණවුම්**

01. මුදල් ඇණවුමක් වලංගු වන්නේ එය නිකුත් කල මාසයේ අවසන් දින සිට මාස 06ක කාල සීමාවක් සඳහා පමණි. එසේම නිකුත් කළ මාසයේ අවසන් දින සිට අවුරුදු දෙකක් ඉක්මගිය මුදල් ඇණවුමක් නැවත වලංගු කිරීමට හෝ එහි වටිනාකම ආපසු ගෙවීමට හෝ නොහැක. එහෙත් වලංගු කාලය ඉකුත් වූ මුදල් ඇණවුමකට විශේෂ අවස්ථා අනුව සලකා එය නිකුත් කළ මාසයේ අවසන් දිනයේ සිට අවුරුදු 02ක් දක්වා මුදල් ගෙවීම ගැන සළකා බලනු ලැබේ. එසේ නොවන මුදල් ඇණවුම්වල වටිනාකම රජයේ ආදායමට බැර කරනු ලැබේ.

02. එසේ වුවත් පහත සඳහන් විශේෂ අවස්ථා යටතේ අවුරුදු දෙකක් ඉක්මගිය මුදල් ඇණවුම්වල වටිනාකම අදාළ ගාස්තු අයකර ගැනීමෙන් පසු රජයේ ආදායමෙන් ආපසු ගෙවීම ගැන සලකා බැලිය හැක.

(i) මුදල් ඇණවුම් අධිකරණය වෙත ඉදිරිපත් කර තිබීම.

(ii) නීතිමය හේතුන් මත ගෙවල් කුළී පාලක මණ්ඩලයක් මගින් මුදල් ඇණවුම් රඳවාගෙන තිබීම.

(iii) මුදල් ඇණවුමේ මුදල ලැබිය යුතු අය විදේශ ගතවී සිටීම. (විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතු ය)

(iv) මුදල් ලැබිය යුතු අය දීර්ඝකාලීනව දැඩි අයහපත් සෞඛ්‍ය තත්වයකින් පසුවීම. (රජයේ වෛද්‍ය නිලධාරියකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයකින් ඒ බව සනාථ කළ යුතු ය)

03. ඉහත 02 (i) හා (ii) යටතට අදාළ මුදල් ඇණවුම් මෙම *ගැසට් නිවේදනයේ* පළකරනු ලබන දින සිට මාස තුනක් ඇතුළත ඉදිරිපත් කළ නොහැකි නම් එවැනි මුදල් ඇණවුම් පිළිබඳ විස්තර අදාළ නඩු අංක ආදිය සමග මුදල් ඇණවුම් සේවා පාලක වෙත ලිඛිතව එවිය යුතුය. මුදල් ඇණවුම් ඉදිරිපත් කිරීමට අපහසු වන්නේ නම් ඒ බව ලිඛිතව දැන්විය යුතු ය.

04. එහෙත් දැනට අධිකරණයේ පවතින නඩු වෙනුවෙන් හා වෙනත් නීතිමය අවශ්‍යතාවයන් සඳහා උසාවි නියෝග මගින් රඳවා ඇති මුදල් ඇණවුම්, ගෙවල් කුළී පාලක මණ්ඩලයක නඩු සම්බන්ධයෙන් රඳවා ගත යුතු මුදල් ඇණවුම්, දෙපාර්තමේන්ත හා අමාත්‍යාංශ මට්ටමින් කරගෙන යනු ලබන විනය පරීක්ෂණයක් සඳහා පාදක වූ මුදල් ඇණවුම් මෙමගින් ආවරණය නොවේ.

05. 2012.01.01 සිට 2012.12.31 වැනි දින දක්වා නිකුත් කරන ලද මුදල් ඇණවුම්වලට අදාළව මෙම නිවේදනය පළකළ දින සිට මාස තුනක් සම්පූර්ණ වන දින තෙක් ලැබෙන පැමිණිලි පමණක් සලකා බැලීමට තීරණය කර තිබේ. මෙය සාමාන්‍ය මුදල් ඇණවුම්, විදුලි මුදල් ඇණවුම්, ෆැක්ස් මුදල් ඇණවුම් හා වටිනාකම ගෙවා භාර ගන්නා මුදල් ඇණවුම් සඳහා අදාළ වේ. එහෙත් ඉහත 02 ඡේදයේ සඳහන් අවස්ථා යටතේ වූ මුදල් ඇණවුම්වල වටිනාකම රාජ්‍ය ආදායමට බැර කර ඇත්නම් එම මුදල් ඇණවුම්වල වටිනාකම මුදල් රෙගුලාසිවලට අනුව ආදායමෙන් ආපසු ගෙවීමක් ලෙස සලකා අදාළ පාර්ශවවලට ගෙවීමට කටයුතු කරනු ලැබේ.

06. එබැවින් ඉහත 02 ඡේදයේ සඳහන් පරිදි මුදල් ඇණවුම් සඳහා මුදල් ආපසු ගෙවීම ගැන සලකා බැලීම පිණිස ලිඛිතව කරනු ලබන ඉල්ලීම් හා අදාළ මුදල් ඇණවුම් ද සමග මුදල් ඇණවුම් සේවා පාලක වෙත පහත සඳහන් ලිපිනයට මෙම *ගැසට් නිවේදනය* පළකළ දින සිට මාස තුනක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු බවට ඒ ඒ පළාත් සඳහා, පළාත් පාලන ආයතන, ගෙවල් කුළී පාලක මණ්ඩලය, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල, රජයේ ආයතන, බැංකු, පුද්ගලික ආයතන සහ මහජනයා වෙතද මෙයින් දැනුම් දෙනු ලැබේ.

පාලක, මුදල් ඇණවුම් සේවා,
මුදල් ඇණවුම් සේවා අංශය,
නියෝජ්‍ය තැපැල්පති (මධ්‍යම) කාර්යාලය,
තැපැල් සංකීර්ණ ගොඩනැගිල්ල,
තැපැල් දෙපාර්තමේන්තුව,
මහනුවර.

07. ඒ අනුව 2012.01.01 වැනි දින සිට 2012.12.31 වැනි දින දක්වා කාලය තුළ නිකුත් කරන ලද මෙම නිවේදනයේ දෙවන ඡේදයේ දැක්වෙන කරුණු හතරට අදාළ නොවන වලංගු කාලය ඉකුත් වූ මුදල් ඇණවුම් සඳහා මුදල් ආපසු ගෙවන මෙන් මෙම *ගැසට් නිවේදනය* පළකළ දින සිට මාස තුනකට පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් භාර නොගන්නා බවත් එවැනි මුදල් ඇණවුම් සඳහා මුදල් ආපසු ගෙවනු නොලබන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

08. 2012.01.01 වැනි දින දිනට පෙර නිකුත් කරන ලද කිසිදු මුදල් ඇණවුමක් සඳහා කුමන හේතුවක් මත වුවද කෙරෙන ඉල්ලීම් සඳහා මුදල් ආපසු ගෙවනු නොලබන බව සලකන්න.

එම්. එච්. අබ්දුල් හලීම්,
මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍ය.

07 - 869

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 1449299, 1589278, 1738550.
නලින් ධනේෂක වීරසේකර.

2015 පෙබරවාරි මස 23 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය විශේෂයෙන් හා ඒකඡන්දයෙන් මෙලෙස නිශ්චය කරනු ලබයි.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එල්. වීරසේකර විසින් 2006 දෙසැම්බර් 01 වැනි දින සහතික කරන ලද අංක 10479, 2007 පෙබරවාරි 20 වැනි දින සහතික කරන ලද අංක 10741, 2008 අගෝස්තු 01 වැනි දින සහතික කරන ලද අංක 12519, 2009 පෙබරවාරි 10 වැනි දින සහතික කරන ලද අංක 13156, 2012 දෙසැම්බර් 21 දින සහතික කරන ලද 18144 සහ 2014 මැයි 13 වැනි දින සහතික කරන ලද අංක 19741 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දාවූද බැඳුම්කරය යටතේ (මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම) අයවිය යුතු මුදල් ගෙවීම නලින් කන්ස්ට්‍රක්ෂන් කම්පනි නමින් තනිපුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන නලින් ධනේෂක වීරසේකර ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද,

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එල්. ජයවීර විසින් 2013 ජනවාරි මස 28 වැනි දින සහතික කරන ලද අංක 3703 සහ 2013 අගෝස්තු මස 01 වැනි දින සහතික කරන ලද අංක 3793 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සීහි නමට ලියන ලද්දා වූද බැඳුම්කරය යටතේ (මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම නලින් කන්ස්ට්‍රක්ෂන් කම්පනි නමින් තනිපුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන නලින් ධනේෂක වීරසේකර ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද,

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එල්. ජයවීර විසින් 2013 අගෝස්තු මස 01 වැනි දින සහතික කරන ලද අංක 3792 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී නමට ලියන ලද්දා වූද බැඳුම්කරය යටතේ (මෙහි තුන්වන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම නලින් කන්ස්ට්‍රක්ෂන් කම්පනි නමින් තනිපුද්ගල වෙළඳ ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යනු ලබන නලින් ධනේෂක වීරසේකර ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද,

එකී බැඳුම්කර යටතේ රුපියල් දෙකෝටි හැටනමලක්ෂ තිස්එක්දාහස් දෙසිය හැත්තෑ හතරයි ශත විසිපහක (රු. 26,931,274.25) මුදලක් 2014 දෙසැම්බර් 31 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්ද එකී රුපියල් දෙකෝටි හැටනමලක්ෂ තිස්එක්දාහස් දෙසිය හැත්තෑ හතරයි ශත විසිපහක (රු. 26,931,274.25) මුදල අයකර ගැනීම සඳහා සහ 2015 ජනවාරි මස 01 වැනි දින සහ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 12,965,400ක මුදල මත 16% සහ රු. 12,000,000ක මුදල මත 15.5% වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 10479, 10741, 12519, 13156, 18144, 19741, 3703, 3793 සහ 3792 දරන බැඳුම්කරයන් යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස් කොට ඇත්තාවූද මෙහි පළවන දෙවන සහ තුන්වන උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තාවූද දේපළ හා පරිශ්‍ර කොළඹ 12 හල්ෆ්ඩ්‍රොප් වීදියේ අංක 182හි 3 වන මහලේ ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, අධිකාරි පත්තුවේ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 656 රයිගම් දකුණ ග්‍රාම නිලධාරි වසමේ රයිගම පිහිටි පැලවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වයි. බී. කේ. කොස්තා විසින් 1981 අප්‍රේල් මස 30 වැනි දින සාදන ලද අංක 1448 දරන පිඹුරේ ලොට් 01 වශයෙන් දක්වෙන ඉඩමට මායිම් වශයෙන්, උතුරට : අඩි පාරෙන් ද, නැගෙනහිරට : පැලවත්තෙහි කොටසකින් ද, දකුණට : ලොට් 02න් ද, සහ බස්නාහිරට : පතවත්ත පාරෙන්ද මායිම්වූ පර්චස් තිස්හතර (අ. 0, රූ. 0, පර්. 34)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි ගහකොළ සහ වැවිලි පස සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව B 121/136 යටතේ ලියාපදිංචි වී ඇත.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, අධිකාරි පත්තුවේ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 665 රඹුක්කන ග්‍රාම නිලධාරි වසමේ රඹුක්කන පිහිටි ගනේවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වයි. කරුණාරත්න කොස්තා විසින් 1999 අගෝස්තු මස 24 වැනි දින සාදන ලද අංක 2617 දරන පිඹුරේ දක්වා ඇති ඉඩමට මායිම් වශයෙන්, උතුරට : ලොට් 1 සහ අංක 1888 දරන පිඹුරේ ඉතිරි කොටසේ ලොට් 2, 3, 4, 5 සහ 6 සහ අංක 1342 දරන පිඹුරේ ලොට් 19න් ද, නැගෙනහිරට : අංක 1342 දරන පිඹුරේ ලොට් 13 (පන්සල් වත්ත) ද, දකුණට : නිමල් සරත්චන්ද්‍ර පෙරේරා හිමිකම් කියන ඔලබොඩුවගේවත්ත හෙවත් මුණමල්ගහවත්ත සහ ගුණසේන පෙරේරාට අයත් මුණමල්ගහවත්තෙන්ද සහ බස්නාහිරට : සංඝමිත්තා මාවතෙන්ද මායිම්වූ එකී අංක 2617 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තිස්හතයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 37.5)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි ගහකොළ වැවිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව B 224/24 යටතේ ලියාපදිංචි වී ඇත.

### තුන්වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, අධිකාරි පත්තුවේ බණ්ඩාරගම ප්‍රාදේශීය සභා සීමාවේ බණ්ඩාරගම ලේකම් කොට්ඨාසයේ 663 බණ්ඩාරගම ග්‍රාම නිලධාරි වසමේ බණ්ඩාරගම පානදුර පාරේ වරිපනම් අංක 109A දරන බමුණුගේවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. බෝපේ ආරච්චි විසින් 2005 ජූලි 25 වැනි දින සාදන ලද අංක 4182 දරන පිඹුරේ ලොට් A2 වශයෙන් දක්වෙන ඉඩමට මායිම් වශයෙන්, උතුරට : මෙහි ලොට් A1 ද, නැගෙනහිරට : අංක 3683 දරන පිඹුරේ ලොට් B ද, දකුණට : අංක 3683 දරන පිඹුරේ ලොට් C ද සහ බස්නාහිරට : මාස්විල පාරෙන්ද මායිම්වූ එකී අංක 4182 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්සයි දශම හයයි අට (අ. 0, රූ. 0, පර්. 20.68)ක විශාලත්වයෙන් වන මෙය හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව B 185/192 යටතේ ලියාපදිංචි වී ඇත.

රංජනී ගමගේ මිය,
සමාගම් ලේකම්.

07 - 804

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

කුසුම්සිරි සප්ලයර්ස්,
ගිණුම් අංක : 0007 1002 0043.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2015 ජනවාරි 29 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. ටී. කේ. වීබැද්ද යන අය විසින් ලියා සහතික කරන ලද 2012 ඔක්තෝබර් මස 04 දාතම හා අංක 2628 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල බඳුකර අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "කුසුම්සිරි සප්ලයර්ස්" යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන් වන දදල්ලගේ නන්දසිරි සිල්වා සහ කුමාරපති මොහොට්ටිලාගේ චිත්‍රා සිල්වා යන අය බන්ධනදායීන් වශයෙන් හා දදල්ලගේ නන්දසිරි සිල්වා යන අය උකස්කරු වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 2628 දරන බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් දෙකෝටි දහ නම ලක්ෂ දහ දහස් හත්සීය හැට නමයයි ශත දහ අටක (රු. 21,910,769.18) මුදලක් 2014 දෙසැම්බර් 22 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දෙකෝටි දහ නම ලක්ෂ දහ දහස් හත්සීය හැට නමයයි ශත දහ අටක (රු. 21,910,769.18) මුදල ද, 2014 දෙසැම්බර් 23 වැනි දින සිට අංක 2628 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි දාහත් ලක්ෂ අනූ හතර දහස් දෙසිය අසූ හතයි ශත විසි හතරක (රු. 11,794,287.24) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ දහනවයක් (19%) හා තවත් රුපියල් ලක්ෂ පනහක (රු. 5,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටක් (18%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 2628 දරන එකී බැඳුම්කර මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි.ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාවන් තුළ පිහිටි කොළඹ වීදියේ වරිපනම් අංක 64 දරන පරිශ්‍රයන් බලයලත් මානන තැන ඒ. එම්. තිලකරත්න යන අය විසින් සාදන ලද 2012 සැප්තැම්බර් මස 25 වැනි දින පිටසන් කරන ලද සහ බලයලත් මානක පී. නානායක්කාර යන අය විසින් සාදන ලද 1990 ජූලි 30 දතම හා අංක 746 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට ලොට් 01 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ඩී. එස්. සේනානායක වීදියේ වරිපනම් අංක 31 දන පරිශ්‍රයන්, නැඟෙනහිරට : කොළඹ වීදියේ වරිපනම් අංක 60 දරන පරිශ්‍රයන්, දකුණට : කොළඹ වීදිය සහ බස්නාහිරට :කොළඹ වීදියේ වරිපනම් අංක 68 දරන පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම දෙකයි තුනයි බිංදුවක් (A. 0, R. 0, P. 3.230) හෝ හෙක්ටයාර 0.00817ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග ය.

එකී ලොට් 1 පහත සඳහන් ඉඩමේ නැවත මිනුවකි :

මධයම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාවන් තුළ පිහිටි කොළඹ වීදියේ වරිපනම් අංක 64 දරන බලයලත් මානක තැන ජියෝ ඊ ද ලා මොට්ටේ යන අය විසින් සාදන ලද 1913 ජනවාරි 27 දාතම දරන පිඹුරේ දක්වෙන සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ඇති ඉඩම සහ පරිශ්‍රයන් ට මායිම් : උතුරට : ලේඩි ද ද සොයිසා යන අයගේ දේපළ, නැඟෙනහිරට : හබීබු යන අයට අයිති එකී අංක 227 දරන පරිශ්‍රයන් සහ නිවස, දකුණට : කොළඹ වීදිය සහ බස්නාහිරට : සිබිබියාලාගේ බිරිඳට අයිති එකී අංක 224 දරන පරිශ්‍රයන් සහ නිවස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම තුනක් (A. 0, R. 0,P. 3.3) ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග වෙළුම/පත්ඉරුව A 322/278 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

07-835

---

**ඩීඑෆ්සීසී වර්ධන බෑන්ක් පීඑල්සී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී වර්ධන බෑන්ක් පීඑල්සී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී වර්ධන බෑන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2014 ඔක්තෝබර් මස 31 වැනි දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී වර්ධන බෑන්ක් පීඑල්සී බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එස්. ගනේගොඩ විසින් ලියා සහතික කරන ලද අංක 733 හා 2008 ජනවාරි මස 31 වැනි දින ද, අංක 734 හා 2008 ජනවාරි මස 31 වැනි දින දරන උකස් බැඳුම්කර දෙක මත ලැබිය යුතු මුදල් ගෙවීම, ආර්. ඇන්ඩ් පී. මෝටර් ට්‍රේඩර්ස් යන නාමය අභිධානය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස කැලණියේ ව්‍යාපාරය කරගෙන යන කඩවත, මහර, එක්සත් මාවත අංක 152/2 දන ස්ථානයේ, නාකුලුගමුව ගමගේ රෝහිත චන්ද්‍රලාල් සහ හෝල්ලුපතිරගේ ප්‍රියානි කල්දේරා යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2014 ජනවාරි මස 31 වැනි දිනට, ඉහත කී නාකුලුගමුව ගමගේ රෝහිත චන්ද්‍රලාල් සහ හෝල්ලුපතිරගේ ප්‍රියානි කල්දේරා යන අයගෙන් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවට රුපියල් එක්කෝටි තිස්අට ලක්ෂ තිස්හත් දහස් තුන්සිය තිස්තුනකුත් ශත පණස් නවයක (රු. 1,38,37,333.59) මුදලක් සහ 2014 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හතළිස් හත්ලක්ෂ විසිපන් දහස් පණස් තුනකුත් ශත දහසයක (රු. 47,25,053.16) මුදලක් සඳහා වර්ෂයකට සියයට විසිපහ (25%) බැගින් සහ රුපියල් පහළොස් දහස් තිස් එකකුත් ශත අනූනවයක් (රු. 15,031.99) සඳහා වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් ගණනය කළ පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් එක්කෝටි තිස්අට ලක්ෂ තිස්හත් දහස් තුන්සීය තිස්තුනකුත් ශත පණස් නවයත (රු. 1,38.37,333.59) මුදලක් සහ 2014 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හතළිස් හත්ලක්ෂ විසිපන් දහස් පණස් තුනකුත් ශත දහසයක (රු. 47,25,053.16) මුදලක් සඳහා වර්ෂයකට සියයට විසිපහ (25%) බැගින් සහ රුපියල් පහළොස් දහස් තිස් එකකුත් ශත අනූනවයක් (රු. 15,031.99) සඳහා වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් ගණනය කළ වැඩිදුර පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී අංක 733 සහ 734 දරන උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තුද සමග අයකර ගැනීම සඳහා මෙහි පහත විස්තර කරන, ඉහත කී අංක 733 දරන උකස් බැඳුම්කරය මගින් එකී හෝල්ලුපතිරගේ ප්‍රියානි කල්දේරා යන අය විසින් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර තිබෙන ඉඩම හා පරිශ(ය සහ ඉහත කී අංක 734 දරන උකස් බැඳුම්කරය මගින් එකී නාකුලුගමුව ගමගේ රෝහිත චන්ද්‍රලාල් සහ හෝල්ලුපතිරගේ ප්‍රියානි කල්දේරා යන අය විසින් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර තිබෙන, ව්‍යාපාර බඩුතොග සහ පොත්ණය (Stocks and Book debts) කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී. වර්ධන බැන්ක් පී.එල්.සී. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 733 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත, තලාහේන ග්‍රාමයේ පිහිටි ගොඩපරගහවත්ත නමැති ඉඩමේ බලයලත් මානක කේ. ජී. ජී. පියසේන විසින් මැන සකස් කළ අංක 2491 හා 2014.10.13 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1A/14 ලකුණු කළ බෙද වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : අංක 674A/2009 දරන පිඹුරේ ලොට් අංක 1A/10, ලොට් අංක 1A/12, ලොට් අංක 1A/13 ද, නැගෙනහිරට : අංක 1050 දරන පිඹුරේ නිරූපිත අඩි 12ක් පළල පාර ද, දකුණට : අංක 489 දරන පිඹුරේ ලොට් 1B ද, බස්නාහිරට : එම්. ආර්. එච්. ආර්. ද සිල්වාගේ දේපළ ද යන මායිම් ඇතුළත පර්චස් තිස්හතකුත් දශම හයයි පහක් (අ. 0, රූ. 0, පර්. 37.65) (හෙ. 0.09522) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ.

මෙහි ඉහත විස්තර කරන ලොට් 1A/14 ලකුණු කළ බිම් කට්ටිය බලයලත් මානක පී. පීලික්ස් ඩයස් විසින් මැන සකස් කළ අංක 489 හා 1992.09.25 වැනි දින දරන පිඹුරේ ලොට් 1A ලෙස නිරූපිත මෙහි පහත සවිස්තරව විස්තර කරන බිම් කට්ටියේ ඉතිරි කොටස වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ලියාපදිංචි කොට්ඨාසය ඇතුළත හේවාගම් කෝරලේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභාවේ බත්තරමුල්ල ඒකක සීමාව ඇතුළත තලාහේන ග්‍රාමයේ පිහිටි ගොඩපරගහවත්ත නමැති ඉඩමේ, බලයලත් මානක පී. ෆීලික්ස් ඩයස් විසින් මැන සකස් කළ අංක 489 හා 1992.09.25 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1A ලකුණු කළ බිම් කට්ටිය වූ ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ සහිත බෙද වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : පාර, නැගෙනහිරට : බලයලත් මානක සී. ද එස්. ගුණතිලක මැන සකස් කල අංක 1050 හා 1984.04.30 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 5 ලකුණු කළ (අඩි 12ක් පළල පාර සඳහා රිසවේසම වූ) බිම් කට්ටිය සහ අඩි 3ක් පළල පාර සඳහා රිසවේසම ද, දකුණට : ඉහත කී අංක 489 දරන පිඹුරේ ලොට් 1B ද, බස්නාහිරට : එම්. ආර්. එච්. ආර්. ද සිල්වා, ජයවතී සහ සුනිල් කැරගල යන අයගේ දේපළ ද යන මායිම් ඇතුළත එකී අංක 489 දරන පිඹුර ප්‍රකාර රූඩ් තුනකුත් පර්චස් එකයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 3, ප. 1.50) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

ඉහතින් විස්තර කර තිබෙන ලොට් අංක 1A ලකුණු කළ බිම් කට්ටිය මෑතකදී සකස් කළ මැනුම් පිඹුරකට අනුව පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ලියාපදිංචි කොට්ඨාසය ඇතුළත හේවාගම් කෝරලේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභාවේ බත්තරමුල්ල ඒකක සීමාව ඇතුළත තලාහේන ග්‍රාමයේ පිහිටි ගොඩපරගහවත්ත නමැති ඉඩමේ, බලයලත් මානක කේ. ඒ. රූපසිංහ විසින් මැන සකස් කරන ලද අංක 1191/2005 හා 2005.10.30 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1A/1 ලකුණු කළ බිම් කට්ටිය වූ ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ සහිත බෙද වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : පාර, නැගෙනහිරට : බලයලත් මානක සී. ද එස්. ගුණතිලක මැන සකස් කල අංක 1050 හා 1984.04.21 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 5 ලකුණු කළ (අඩි 12ක් පළල පාර සඳහා වෙන්කළ) බිම් කොටස ද, දකුණට : බලයලත් මානක පී. ෆීලිකිස් ඩයස් මැන සකස් කළ අංක 489 හා 1992.09.25 වැනි දින දරන පිඹුරේ ලොට් 1B ද, බස්නාහිරට : කැරගලට, ජයවතීට සහ එම්. ආර්. එච්. ආර්. ද සිල්වාට අයිති ඉඩම් ද යන මායිම් ඇතුළත ඉහත සඳහන් 1191/2005 දරන පිඹුර ප්‍රකාර රූඩ් තුනකුත් පර්චස් එකයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 3, ප. 1.50) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම වේ.

මෙයට බලයලත් මානක එච්. බර්ටි බුද්ධිසේන මැන සකස් කල අංක 674/A/2009 ජුනි මස 18 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1A/3 දරන බිම් කට්ටිය සහ බලයලත් මානක සී. ද එස්. ගුණතිලක මැන සකස් කළ අංක 1050 හා 1984 අප්‍රේල් මස 30 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 5 දරන බිම් කට්ටිය මතින් පළමු උකස්කරුට ද ආගන්තුකයන්ට, ඉංජිනේරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, ගෘහනිර්මාණශිල්පීන්ට, කම්කරුවන්ට, සේවකයන්ට, කුළී නිවැසියන්ට, අවසරලාභීන්ට හා ආරාධිතයන්ට මින් ඉදිරියට සෑම වේලාවකම ඔවුන්ගේ අභිප්‍රාය හා කැමැත්ත පරිදි කවර හෝ කාර්යයක් සඳහා දිවා හෝ රාත්‍රී කාලයේ පාගමනින් හෝ වෙනත් ඕනෑම ආකාරයකින් අශ්වයන්, ගවයන් හෝ වෙනත් සතුන් සමග හෝ නොමැතිව ද මෝටර්කාර්, මොටර් ලොරි සහ සෑම ආකාරයකම වෙනත් වාහන මගින් බර පටවා හෝ නොපටවා, මෙහි විශේෂයෙන් විස්තර කරන මාර්ග පහසුකම තුළින් මතින් සහ/හෝ

ඔස්සේ සෑම කල්හිම යාම ඊමට හා ප්‍රත්‍යාගමනය කිරීමටද ඇතුළුවීමට හා පිටවීමට ද පූර්ණ හා බාධා විරහිත අයිතිවාසිකම නිදහස හා අවසරය ද එම බිමෙන්, එය ඔස්සේ සහ ඊට ඉහළින් විදුලි රැහැන්, මුදුන් කම්බි ඇදීමේ සහ ගෑස්, ජලාපවහන හා ජලනල එලීමේ හා වෙනත් කවර වූ හෝ ආකාර උවාරණ හා උපක්‍රම යෙදීමේ අයිතියද ඇතුළත් වේ.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත, තලාහේන ග්‍රාමයේ පිහිටි ගොඩපරගහවත්ත නමැති ඉඩමේ බලයලත් මානක එච්. බර්ටි බුද්ධිසේන විසින් මැන සකස් කළ අංක 674A/2009 ජුනි 18 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1A/4 ලකුණු කළ බිම් කට්ටිය වූ බෙදා වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරු - නැගෙනහිරට :ලොට් අංක 1A/1 ද, දකුණු-නැගෙනහිරට : ලොට් අංක 1A/8 ද, දකුණු-බස්නාහිරට : ලොට් 1A/7 ද, උතුරු-බස්නාහිරට : ලොට් 1A/3 (නිවසක් සඳහා අඩි 10 පලල පාර ද) යන මායිම් ඇතුළත හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි එකයි පහයි දෙකක් (හෙ. 0.0152) නොහොත් පර්චස් හයක් (අ. 0, රූ. 0, ප. 6.00) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ.

මෙහි ඉහතින් ලොට් 1A/4 ලෙස විස්තර කර තිබෙන බිම් කොටස මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම නැවත මැන අනුබෙදීමක් වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ලියාපදිංචි කොට්ඨාසය ඇතුළත හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභාවේ බත්තරමුල්ල ඒකක සීමාව ඇතුළත තලාහේන ග්‍රාමයේ පිහිටි ගොඩපරගහවත්ත නමැති ඉඩමේ බලයලත් මානක පී. ෆීලික්ස් ඩයස් විසින් මැන සකස් කරන ලද අංක 489 හා 1992.09.25 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1A ලෙස ලකුණු කළ බිම් කට්ටිය වූ ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ සහිත බෙද වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : බලයලත් මානක සී. ද එස්. ගුණතිලක මැන සකස් කල අංක 1050 හා 1984.04.30 දින දරන පිඹුරේ ලොට් අංක 5 ලකුණු කළ (අඩි 12ක් පළල පාර සඳහා රිසවේසම වූ) බිම් කට්ටිය සහ අඩි 3ක් පළල පාර සඳහා රිසවේසම ද, දකුණට : ඉහත කී අංක 489 දරන පිඹුරේ ලොට් 1B ද, බස්නාහිරට : එම්. ආර්. එච්. ආර්. ද සිල්වා, ජයවතී සහ සුනිල් කැරගල යන අයගේ දේපළ ද යන මායිම් ඇතුළත එකී අංක 489 දරන පිඹුර ප්‍රකාර රූඩ් තුනකුත් පර්චස් එකයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 3, ප. 1.50) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

ඉහතින් විස්තර කර තිබෙන ලොට් අංක 1A ලකුණු කළ බිම් කට්ටිය මෑතකදී සකස් කල මැනුම් පිඹුරකට අනුව පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ලියාපදිංචි කොට්ඨාසය ඇතුළත හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභාවේ බත්තරමුල්ල ඒකක සීමාව ඇතුළත තලාහේන ග්‍රාමයේ පිහිටි ගොඩපරගහවත්ත නමැති ඉඩමේ බලයලත් මානක කේ. ඒ. රූපසිංහ විසින් මැන සකස් කරන ලද අංක 1191/2005 හා 2005.10.30 දින දරන පිඹුරේ ලොට් අංක 1A/1 ලකුණු කළ බිම් කට්ටිය වූ ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ සහිත බෙද වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : බලයලත් මානක සී. ද එස්. ගුණතිලක මැන සකස් කල අංක 1050 හා 1984.04.21 දින දරන පිඹුරේ ලොට් අංක 5 ලකුණු කළ (අඩි 12ක් පළල පාර සඳහා වෙන්කළ) බිම් කොටස ද, දකුණට : බලයලත් මානක පී. ෆීලික්ස් ඩයස් මැන සකස් කළ අංක 489 හා 1992.09.25 දින දරන පිඹුරේ ලොට් 1B ද, බස්නාහිරට : කැරගලට, ජයවතීට සහ එම්. ආර්. එච්. ආර්. ද සිල්වාට අයිති ඉඩම් ද යන මායිම් ඇතුළත ඉහත සඳහන් 1191/2005 දරන පිඹුර ප්‍රකාර රූඩ් තුනකුත් පර්චස් තුනයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 3, ප. 3.50) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම වේ.

මෙයට බලයලත් මානක එච්. බර්ටි බුද්ධිසේන මැන සකස් කල අංක 674A/2009 ජුනි 18 දින දරන පිඹුරේ ලොට් අංක 1A/3 ලකුණු කල බිම් කට්ටිය මතින් පළමු උකස්කරුට ද ආගන්තුකයන්ට, ඉංජිනේරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, ගෘහනිර්මාණශිල්පීන්ට, කම්කරුවන්ට, සේවකයන්ට, කුලී නිවැසියන්ට, අවසරලාභීන්ට හා ආරාධිතයන්ට මින් ඉදිරියට සෑම වේලාවකම ඔවුන්ගේ අභිප්‍රාය හා කැමැත්ත පරිදි කවර හෝ කාර්යයක් සඳහා දිවා හෝ රාත්‍රී කාලයේ පාගමනින් හෝ වෙනත් ඕනෑම ආකාරයකින් අශ්වයන්, ගවයන් හෝ වෙනත් සතුන් සමග හෝ නොමැතිව ද මෝටර්කාර්, මෝටර් ලොරි සහ සෑම ආකාරයකම වෙනත් වාහන මගින් බර පටවා හෝ නොපටවා, මෙහි විශේෂයෙන් විස්තර කරන මාර්ග පහසුකම තුළින් මතින් සහ/හෝ ඔස්සේ සෑම කල්හිම යාම ඊමට හා ප්‍රත්‍යාගමනය කිරීමටද ඇතුළුවීමට හා පිටවීමට ද පූර්ණ හා බාධා විරහිත අයිතිවාසිකම නිදහස හා අවසරය ද එම බිමෙන්, එය ඔස්සේ සහ ඊට ඉහළින් විදුලි රැහැන්, මුදුන් කම්බි ඇදීමේ සහ ගෑස්, ජලාපවහන හා ජලනල එලීමේ හා වෙනත් කවර වූ හෝ ආකාර උවාරන හා උපක්‍රම යෙදීමේ අයිතියද ඇතුළත් වේ.

අංක 734 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මාලබේ තලාහේන, සමනල මාවතේ අංක 162/3A දරන ස්ථානයේ බත්තරමුල්ල ගුදමේ ගබඩා පරිශ්‍රය තුළ සහ මත 2008 ජනවාරි 25 දිනට ඇත්තා වූ සහ

| *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|
| 12 ප්‍රමාණයේ කොටස් 4 වීල් කවර් | කට්ටල 200 |
| 13 ප්‍රමාණයේ කොටස් 4 වීල් කවර් | කට්ටල 260 |
| 14 ප්‍රමාණයේ කොටස් 4 වීල් කවර් | කට්ටල 180 |
| ස්ටියරිං වීල් කවර් (M) | 280 |
| වින්ඩ්ස්ක්‍රීන් ස්ටිකර් | 155 |
| ස්ටියරිං වීල් | 110 |
| B.Es කිට් | 100 |
| 2 Din Car DVF/Mp4 | කට්ටල 20 |
| කාර් කැසට් (Re-) | කට්ටල 80 |
| සොලෙක්ස් කාර් ටී.වී. ඇන්ටෙනා | කට්ටල 100 |
| කාර් ස්පීකර්/සබ් වූෆර් | කට්ටල 20 |
| කාර් ස්පීකර් | කට්ටල 200 |
| කාර් එලාම් සිස්ටම් | කට්ටල 60 |
| සෙන්ටර් ලොක් සිස්ටම් | කට්ටල 30 |

ඇතුලුව, උකස්කරුවන් විසින් දැනට ව්‍යාපාරය කරගෙන යන හෝ මින් මතු යම් අවස්ථාවක හෝ කලින් කල ව්‍යාපාරය කරගෙන යනු ලැබිය හැකි වෙනත් යම් ගුදම්, ගබඩා සහ පරිශ්‍ර තුළ හෝ මත තිබෙන හෝ එම ව්‍යාපාර බඩු තොග, වෙළඳ ද්‍රව්‍ය, බඩු බාහිරාදිය සහ දේවල් ද, අමුද්‍රව්‍ය, ප්‍රගාමී වැඩ, නිමි හා නොනිමි භාණ්ඩ සහ සෑම ආකාරයකම හා සෑම විස්තරයකටම අයත් වෙනත් අයිතම සහ වෙනත් චංචල දේපළ කවර හෝ වේලාවක හෝ කලින් කළ හා සෑම කල්හිම ගබඩාකර, තබා හෝ දමා තිබිය හැකි ව්‍යාපාර බඩුතොග, වෙළඳ ද්‍රව්‍ය බඩු බාහිරාදිය හා දේවල් සහ අමුද්‍රව්‍ය, ප්‍රගාමී වැඩ, නිමි හා නොනිමි භාණ්ඩ සහ වෙනත් කවර හෝ ආකාරයක හෝ ස්වභාවයක අයිතම සහ චංචල දේපළද මෙම සාධන පත්‍රය බලාත්මකව පවත්නා කාලය තුළින් ඉදිරියට යම් අවස්ථාවක, කලින් කල හෝ සෑම කල්හිම එකී ගුදම්, ගබඩා හෝ පරිශ්‍රවලට ගෙනැවිත් ගබඩා කර තබා හෝ දමනු ලැබ තිබිය හැකි එකී ව්‍යාපාර බඩුතොග, වෙළඳ ද්‍රව්‍ය, බඩු බාහිරාදිය හා දේවල් ද හෝ උකස්කරුවන් විසින් මතු යම් අවස්ථාවක, කලින් කල හෝ සෑමකල්හිම ඔවුන්ගේ ව්‍යාපාරය හෝ කර්මාන්තය ඉවත් කරගෙන යනු ලැබිය හැකි හෝ පවත්වාගෙන යනු ලැබිය හැකි ස්ථානයක හෝ ස්ථානවල ඇති ඔවුන්ගේ ව්‍යාපාර බඩුතොග, වෙළඳ ද්‍රව්‍ය, බඩුබාහිරාදිය, අමුද්‍රව්‍ය, ප්‍රගාමී වැඩ, නිමි භාණ්ඩ සහ නොනිමි භාණ්ඩ හා ඉහත සඳහන් ගුදම් ගබඩා සහ පරිශ්‍ර තුළට ව්‍යාපාර ස්ථානවලට නැතහොත් ස්ථානවල සිට ගෙනයමින් පවතින හෝ ඉහත කී ජනරජයේ, කොළඹ දිස්ත්‍රික්කයේ වාප්පුවලින් හෝ ගබඩාගාරවල නැව්ගතකිරීම හෝ නිශ්කාෂනය තෙක් රඳවාගෙන තිබෙන සමස්ථ ව්‍යාපාර බඩුතොග, වෙළඳ ද්‍රව්‍ය, වෙනත් අයිතම හා වෙනත් කවර හෝ ආකාරයක හා විස්තරයකට අයත් චංචල දේපළ ද වේ.

ලක්ෂ්මන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරි.

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී,
අංක 73,
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

07 - 851